චක්‍රලේඛ අංක :05/2002 නොතාරිස්.

මගේ අංකය:ප්‍ර.නො.01/15/චක්‍ර 2002,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 340, ආර්.ඒ.ද මැල් මාවත,
කොළඹ 03.
2002.05.13 දින.

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

## <u>මුද්දර ගාස්තු අහෝසි කිරීම.</u>

ඉහත කරුණට අදාලව මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් 2002.05.09 දිනැතිව දිනමිණ පුවත් පත මගින් නිකුත් කරන ලද දැන්වීමක ඡායාපිටපතක් ඔබගේ දැන ගැනීම පිණිස මේ සමග එවමි.

02. මෙම පුවත්පත් නිවේදනයේ සඳහන් ලේඛණ සඳහා අය කෙරෙන මුද්දර ගාස්තු 2002.05.01 දින සිට අහෝසි කර ඇත.

03. ලේඛණ ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ අයකරනු ලබන පහත සඳහන් ගාස්තුවල වෙනසක් සිදු වී නොමැති නිසා ඒවා තවදුරටත් අයකල යුතුය.

1. ලියාපදිංචි කිරීමේ ගාස්තු (අවලංගු නොකළ මුද්දර මගින් අයකරන)
2. උධෘත ඔප්පු පිටපත් පිටපත් කිරීමේ ගාස්තු.
3. සෙවීම් ගාස්තු.

04. ඔප්පු සහතික පිටපත් හා ඉඩම් ලේඛණ උධෘත සහතික කිරීමේ දී අයකරනු ලබන මුද්දර ගාස්තුද (රු. 2.50 බැගින් වන) 2002.05.01 දින සිට අහෝසි කර ඇත.

05. කරුණාකර මේ අනුව කටයුතු කරන්න. මේ සම්බන්ධවගැටළුවක් වේ නම් කරුණාකර මගෙන් හෝ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (ලේඛණ ලියාපදිංචි කිරීම) වෙතින් විමසන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත:.
1. ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් වෙත.
2. සියළුම කලාපභාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත.
3. නොතාරිස් සංගම් වෙත.

# මුද්දර ගාස්තුව අහෝසි කිරීම

X 2002 මැයි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මධ්‍යම රජය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ සියලුම මුද්දර ගාස්තු අහෝසි කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ

X මේ අනුව 13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පළාත් සභාවලට පවරන ලද විෂයයන් වන නිශ්චල දේපල පැවරීම (එනම් විකිණීම, තෑගිදීම සහ උරුමයෙන් ලැබීම ලියාදීම) මත මුද්දර ගාස්තුව, අධිකරණ නඩු කටයුතු වලදී ඉදිරිපත් කරන ලියවිලි මත මුද්දර ගාස්තුව සහ මෝටර් වාහන පැවරීමේදී පැනවිය හැකි මුද්දර ගාස්තුව හැරුණ විට අනෙකුත් සියලුම මුද්දර ගාස්තු අහෝසි කර ඇත.

X මේ අනුව පහත සඳහන් ලේඛණ මත මින් ඉදිරියට මුද්දර ඇලවීක් හෝ මුද්දර ගාස්තු යනුවෙන් මුදල් අයකිරීමක් හෝ සිදු නොකළ යුතුය.

(I) නිශ්චල දේපල බදු දීමේ හෝ උකස් කිරීමේ ඔප්පු හෝ වෙනත් ලියවිලි ඕනෑම දේපලක් බදු දීමේ හෝ බදු කුලියට දීමේ ලේඛන

(II) මුදල් (චෙක්පත් ඇතුළුව) හෝ චංචල දේපල ලැබුණු බවට පිළිගැනීමේ කුවිතාන්සි උදා: වැටුප් (ලේඛණ), ගමන් ගාස්තු, වැනල් ගාස්තු යැපීම් දීමනා, භාණ්ඩ හා සේවා විකිනීම/ සැපයීම, භාණ්ඩ උකස් කිරීමේදී මුදල්/ භාණ්ඩ භාර ගැනීම්, ලැබිය යුතු (ණය) මුදලක් වෙනුවෙන් චංචල දේපල භාර ගැනීමේ යනාදී විවිධ අවස්ථාවල අදාල ලේඛණ/ කුවිතාන්සිය.

(III) දිවුරුම් පෙත්සම්, ඇටෝර්නි බලපත්‍ර, ප්‍රොක්සි

(IV) ගිවිසුම් ණය ගිවිසුම් ඇප (කර) ගිවිසුම්, භාණ්ඩ හෝ සේවා සැපයීමේ කොන්ත්‍රාත් ඉදිකිරීම් කොන්ත්‍රාත් වාහන හා වෙනත් දේපල වෙනු වෙන් වාණිජ කල්බදු ගිවිසුම්, ගෙවල් කුලී ගිවිසුම් අනාගත විකිණීමක් දේපල උකස් කිරීමක්, භාණ්ඩ උකස් කිරීමක්, හෝ ඕඩපත උදෙසා එලඹෙන ගිවිසුම් සහ හවුල් ව්‍යාපාර ගිවිසුම් යනාදී සියලු ආකාරයේ ගිවිසුම්.

(V) රජයේ නිලධාරීන් නිකුත් කරන සහතික සහතික: උදා: කිසියම් ලේඛණයක උධෘතයක් සහතික කිරීම, ගමන් බලපත්‍ර පිටපත් සහතික කිරීම.

(VI) රක්ෂණ ඔප්පු හවුල් ව්‍යාපාර පිහිටුවීමේ සාධ: පත්‍ර

(VII) ණයවර ලිපි, විනිමය බිල්, වාණිජ පත්‍ර සහ වාණිජ ඉන්වොයිස් පත්‍ර, චෙක්පත් බැංකු ඇපක සහ වෙනත් ඇපකර.

(VIII) බැංකුවකින් මුදල් ආපසු ගැනීමේ ලිපවිලි බැ ණය ලියවිලි පත්, සී. ඩී සහතික සංචාරක චෙක්පත්, ණයපත් ගනුදෙනු.

(IX) ආනයන ඉන්වොයිස් පත්‍ර, නැව් බඩු බිල, අපනයන ලේඛණ.

(X) යම් දේපලකට බලපාන, නිශ්චිත මුදලක් වෙනුවෙන් නිකුත් කරන බැඳුම්කර ඕඩපත, විකුණුම් බිල් හෝ උකස්කර සහ වාණිජ කල්බ ගිවිසුම් සම්බන්ධ උකස්කර.

(XI) ඇප බැඳුම්කර, කාර්ය සාධන බැඳුම්කර, භාර් රක්ෂණ යනාදිය සහ අපනයනකරුවන් රේගු අධ්‍යක්ෂ ජනරාල්ට ඉදිරිපත් කරන බැඳුම්කර

(XII) සමාගම් කොටස් නිකුත් කිරීම හා පැවරීම, ෙ පත්‍ර නිකුත් කිරීම/පැවරීම.

(XIII) බැඳුම්කර, උකස්, බදු, තීන්දු ණය, ව්‍යාපාර, රක්ෂණ ඔප්පු යනාදිය පැවරීම සහ දේපලස භාරයක් බවට හැරවීමේදී කරනු ලබන පැ

(XIV) යානාවක් කුලියට දීම නැවක්/යානාවක්/ගුවං යානයක් සම්බන්ධ ඕනෑම වැඩපිළිවෙළක්.

(XV) පොරොන්දු, නෝට්ටු, බ්‍රෝකරු, නෝට්ටු.

(XVI) භාර දීමේ නියෝග

(XVII). නොතාරිස්වරයෙකු හැටියට කටයුතු කිරීමට දෙන බලපත්‍රය සහ විවිධ බලපත්‍ර වර්ග පළාත් සභාවලට පැවරී ඇති විෂය ඛණ්ඩ තුන සම්බන්ධ ලේඛන හැර වෙනත් ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් දැනට මුද්දර ගාස්තු අය කරන ලේඛණ/ලියවිලි/සාදන පත්‍ර/බලපත්‍ර.

ජේ. චරිත රත්වත්ත,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.